**පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) - 2018**

----------------------------------------------------------------------------------------

පළාත් පාලනය වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතියේ (පුරනැගුම) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2011 ඔක්තෝබර් 21 දින එළඹී අංක 2790 - එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාව සහ 2016 නොවැම්බර් 02 දින එළඹී අංක 3431 -එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම්වලට අනුව, අභ්‍යන්තර සහ ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර පළාත් 07හි පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, ගිණුම් කටයුතුභාවය හා මූල්‍යමය හා තාක්ෂණිකව ශක්තිමත් වූ පළාත් පාලන ආයතන මඟින් දියුණු පළාත් පාලන යටිතල පහසුකම් හා කාර්යක්ෂම සේවා සැපයීමක් ඉටුකර ගැනීමයි. ව්‍යාපෘතියේ පසු ණය මුදලෙහි අරමුණු වනුයේ දැඩි ලෙස වකුගඩු රෝගයෙන් බලපෑමට ලක් වූ ශ්‍රී ලංකාවේ පළාත් 07 හි අඩු දියුණු ප්‍රදේශවල පළාත් පාලන ආයතන හා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ යටිතල පහසුකම් හා සපයන සේවා දියුණු කිරීම වේ. එම නිසා, ජල සැපයුම් පද්ධති, යටිතල පහසුකම්, මූලික සේවා සැපයීම් පිළිබඳ පළාත් පාලන ප්‍රතිපත්තිය ප්‍රතිසංස්කරණය සහ ධාරිතා වර්ධනය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළු පිළිබඳව අවධානය යොමු කිරීම අරමුණු වේ. ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 8,940 කට සමාන එජඩො මිලියන 68.80 ක් වූ අතර එයින් රු.මිලියන 7,670 කට සමාන එජඩො මිලියන 59 ක් මූල්‍යයනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු . 2012 ජුලි 01 දින ආරම්භ කරන ලද අතර 2015 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2017 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය | ව්‍යාපෘති සමාලෝචන කමිටු රැස්වීම් මාස 2 කට වරක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රැස්වීම් 4 ක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු කාර්යක්ෂමව සිදු නොවේ. | අනපේක්ෂිත දේශපාලනික හේතූන් මත 2018 වර්ෂයේ දී සමාලෝචන කමිටු රැස්වීම් 04 වතාවක් පමණක් පවත්වා තිබුණි. | ව්‍යාපෘති සමාලෝචිත කමිටු රැස්වීම් නිතිපතා පැවැත්වීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබද භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ව්‍යාපෘතිය පළාත් 07 ක පළාත් පාලන ආයතන 105 ක් සඳහා ඔවුන්ගේ යටිතල පහසුකම් අවශ්‍යතා වැඩිදියුණු කර ගැනීමට සහයෝගය දක්වා තිබුණු අතර, පෙර වර්ෂයේ අවසාන වන විට අදාළ පළාත් පාලන ආයතන 178 ක සංවර්ධන කටයුතු සම්පූර්ණ කර තිබුණි. තවද, අතිරේක ණය පහසුකම් යටතේ පළාත් පාලන ආයතන 29 ක ජල සම්පාදන ව්‍යාපෘති 29 ක්, ඉදි කිරීම් කටයුතු 35 සිදු කිරීමට සැලසුම් කර තිබුණු අතර, ඉන් සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාලන ආයතන 04 ක ජල සම්පාදන ව්‍යාපෘති 04 ක් සම්පූර්ණ කර තිබුණි. එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සම්බන්ධ ගැටළු පහත දක්වා ඇත.

| ක්‍රියාකාරකම | 2018 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය | | ප්‍රමාදය මාස | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | අපේක්ෂිත % | අත්කර ගැනීම් % | | | | |
| නුවර වැව ජල පිරිපහදුවේ ධාරිතාව වර්ධනය කිරීම | 40 | 5 | 21 | (අ) පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා යෑම | ණය නියෝජිතායතනයේ එකඟතාවය ප්‍රමාදවීම හේතුවෙන් කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදවීම. | ප්‍රමාදයන් ආවරණය කර ගැනීමට සහ අමතර පියවර වළක්වා ගැනීමට නියමිත කාලයේදී කොන්ත්‍රාත් වැඩ අවසන් කිරීම සහතික වීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |
| **ජල සැපයුම් පද්ධතිය දීර්ඝ කිරීම** | | | | | | |
| ඉබ්බාගමුව ජල සැපයුම් පද්ධතිය | 100 | 85 | 13 | (ආ) අපේක්ෂිත පාර්ශවයන් වෙත බලාපොරොත්තු වනප්‍රතිලාභ නොලැබීම. | කොන්ත්‍රාත්කරුවන්ගේ අඩු කාර්යසාධනය | - එම - |
| බුත්තල ජල සැපයුම් යෝජනා ක්‍රමය | 55 | 30 | 20 | | | - එම - |
| **සිවිල් ඉදිකිරීම් කටයුතු** | | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| බෙන්තොට සතිපොළ | 70 | 20 | 11 | ප්‍රදේශීය සභාව විසින් බිම් ගොඩකිරීමේ ප්‍රමාදය හේතුවෙන් | - එම - |
| මහර ප්‍රාදේශීය සභාවේ බහුකාර්ය ගොඩනැගිල්ල | 100 | 70 | 8 | කොන්ත්‍රාත්කරුවන්ගේ අඩු කාර්යසාධනය | - එම - |
| ජා-ඇල ප්‍රාදේශීය සභාවේ කඳාන බහුකාර්ය ගොඩනැගිල්ල | 75 | 32 | 11 | - එම - | - එම - |
| වත්තල ප්‍රාදේශීය සභාවේ මහබාගේ බහුකාර්ය ගොඩනැගිල්ල | 80 | 63 | 10 | - එම - | - එම - |
| කටාන ප්‍රාදේශීය සභාවේ කදිරන ශ්‍රවණාගාරය / ප්‍රජා ශාලාව | 40 | 22 | 14 | අත්තිවාරමේ බලාපොරොත්තු නොවූ පාංශු තත්ත්වය හේතුවෙන් කටයුතු මාස 4 ක් ප්‍රමාද විය. | - එම - |

**3.2 වැඩබිම් පරීක්ෂාවේදී කරනු ලැබූ නිරීක්ෂණයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| **(අ) බලපිටිය බහුකාර්ය ගොඩනැගිල්ල** | | | |
| අනුමත ශක්තිය නියුට්‍රෝන 40 ක් වෙනුවට නියුට්‍රෝන 30 ක අඩු ශක්තියක් සහිත ඉන්ටලොක් කුට්ටි යොදා ගැනීමට කොන්ත්‍රාත්කරු ඉඩ දී තිබුණි. සිදු කරන ලද තාක්ෂණික පරීක්ෂණවලට අනුව කොන්ත්‍රාත්කරු විසින් නියුට්‍රෝන 30 ක අඩු ශක්තියක් සහිත ඉන්ටලොක් කුට්ටි භාවිතා කර තිබුණු බව භෞතික සන්නිරීක්ෂණයේදී නිරීක්ෂණය විය. | අඩු කල් පැවැත්ම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කරගත නොහැකි වේ. | පිරිවිතරයන්ට අනුව ඉදි කිරීම සඳහා යොදා ගන්නා ලද කුට්ටි සාධාරණ ශක්තිමත්භාවයකින් යුක්ත වේ. | කොන්ත්‍රාත්කරුවන් නිත්තරයෙන් ගුණාත්මක ප්‍රමිතිවලට අනුව කටයුතු කරන බව අධීක්ෂණ කාර්ය මණ්ඩලය තහවුරු කිරීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව මඟින් ඉදි කරන ලද පුස්තකාල ගොඩනැගිල්ල, ශ්‍රවණාගාරය සහ වාහන රථගාල**<br><br>පරීක්ෂණ ඉදි කිරීම් සඳහා භාවිතා කරන ලද දොරවල් සවි කිරීම්, ජනෙල් වීදුරු සහ සෝපානය යනාදි ගොඩනැගිලි ද්‍රව්‍ය පිරිවිතරයන් සමඟ අනුකූල වී නොතිබුණි. | - එම - | විධිමත් ලෙස අදහස් දක්වා නොතිබුණි. | - එම - |

## 3.3 අක්‍රීය සහ ඌනඋපයෝජිත සම්පත්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ජල සම්පත හිඟකම හේතුවෙන් වනාතවිල්ලුව ප්‍රදේශයේ ජල සැපයුම් පද්ධතිය අක්‍රීයව පැවතුණි. | ප්‍රදේශයේ පවුල් 4,333 ක් සඳහා ජල සැපයුම් පහසුකම් නොමැත. | එකඟ වූ පරිදි ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය ජල සැපයුම් සම්බන්ධතාවය සපයා නොතිබුණි. පසු විපරම් කටයුතු සඳහා පියවර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | ප්‍රතිලාභීන් වෙත පහසුකම් සැපයීමට ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගත යුතුය. |
| (ආ) | රිදීගම බහුකාර්ය ගොඩනැගිල්ල සහ බස් නැවතුම්පොළ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ළඟා වී නොතිබුණි. | ප්‍රාදේශීය සභාව මහල් දෙක එකවර විවෘත කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, ඉහළ මහල දැනටමත් ඉදි කිරීම් සිදු කරමින් පවතී. පසු විපරම් කටයුතු සඳහා පියවර ගැනීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | - එම -. |
| (ඇ) | මගීන්ගේ ආරක්ෂාව සහ අනෙකුත් පහසුකම් නොසලකා මාවතගම බස් | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී | ව්‍යාපෘතිය බස් නැවතුම්පොළ සඳහා ලබා දෙන ලද ප්‍රතිපාදනයෙන් බිම් මහල ඉදි කර තිබුණි. ඉහළ | ඉදි කරන ලද ගොඩනැගිල්ල භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | නැවතුම්පොළ එහි කටයුතු ආරම්භ කර තිබුණි. | නොතිබුණි. | මහල ඉදි කිරීම සඳහා ප්‍රාදේශීය සභාව එකඟ වී තිබුණි. ඉහළ මහලේ වහලය බස් නැවතුම්පොළවල් සඳහා නවාතැනක් ලෙස යොදාගැනීමට අපේක්ෂි කෙරේ. පසු විපරම් කටයුතු සඳහා පියවර ගැනීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත. | |
| (ඇ) | ජල බවුසර් හිඟකම හේතුවෙන් පොල්පිතිගම ජල සැපයුම් පද්ධතිය භාවිතා නොකර පවතී. | ප්‍රදේශයේ පවුල් 1,700 සඳහා ජල සැපයුම් පහසුකම නොමැත. | මෙම ජල යෝජනා ක්‍රමය 2017 දී අවසන් වූ අතර, නිවාස සඳහා සම්බන්ධතා 350 ක් ඉහල මට්ටමක පවතී. ජල සැපයුම ලබා දීම සඳහා ජල බවුසර යොදා ගැනීමට යෝජනා කර ඇත. | අපේක්ෂිත අරමුණු විධිමත් ආකාරයට ළඟාකර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඉ) | පිවිසුම් මාර්ග නොමැත වීම හේතුවෙන් මීගහකියුල බස් නැවතුම්පොළ නිශ්කාර්යව පැවතුණි. | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙල කරන ලද නගර සැලසුම මත මීගහකියුල බස්නැවතුම්පොළ ඉදි කර ඇති අතර බස්නැවතුම්පොළ සඳහා පිවිසුම් මාර්ග ඉදි කිරීමේ වගකීම ව්‍යාපෘතියේ විෂය පථයට නොමැති අතර, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවතී. | බස් නැවතුම්පොළ කාර්යක්ෂම ආකාරයට භාවිතා කිරීම සඳහා පිවිසුම් මාර්ග ඉදි කිරීමට ප්‍රාදේශීය සභාව වෙත සහාය ලබා දීමට පියවර ගත යුතුය. |
| (ඊ) | පිවිසුම් මාර්ග සහ ජල සැපයුම් සේවාව නොමැති වීම හේතුවෙන් බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාවේ සතිපොළ සහ බහුකාර්ය ගොඩනැගිල්ල නිශ්කාර්යව පවතී. | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | උමා ඔය ව්‍යාපෘතිය සම්බන්ධ ගැටළු මත කෘෂිකාර්මික ක්‍රමය අසාර්ථක වීම හේතුවෙන් ඉදි කිරීම් අවසන් කිරීමෙන් පසු සතිපොළ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. කටයුතු ආරම්භ කිරීමට පළාත් සභාව පියවර ගැනීමට නියමිතය. | ගොඩනැගිල්ල අනෙකුත් සංවර්ධන කටයුතු අපේක්ෂිත අරමුණු සඳහා භාවිත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට පියවර ගැනීම ගත යුතුය. |
| (උ) | පොදු මහජනතාවගේ භාවිතය සඳහා රත්තොට ප්‍රාදේශීය සභාවේ සතිපොළ විවෘත කර නොතිබුණි. | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | ප්‍රාදේශීය සභාව වෙත ගොඩනැගිලි භාරදීමෙන් පසු ඔවුන්ගේ අරමුදල්වලින්කොටස් වෙන්කිරීම සඳහා පියවර ගෙන තිබුණි. සතිපොළ විවෘත කිරීමට කඩිනම් පියවර ගනු ලැබේ. | අපේක්ෂිත අරමුණ සඳහා ගොඩනැගිල්ල භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඌ) | ඉල්ලුම නොමැති වීම හේතුවෙන් විල්ගමුව ප්‍රදේශයේ ආදාහනාගාරය ඌණ උපයෝජිතව පවතී. | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | අඩු ජනගහනය සහ ප්‍රදේශයේ ප්‍රමාණවත් සුසාන භූමි පැවතීම හේතුවෙන් ආදාහනාගාරය භාවිතය සඳහා ඉල්ලුම අඩු වේ. අවට ප්‍රදේශයේ ඇළ හරහා පාලම වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාව විසින් ප්‍රාදේශීය සභාව වෙත අරමුදල් වෙන්කර තිබුණු අතර ඉන්පසු ආදාහනාගාරය සඳහා වැඩි ඉල්ලුමක් පවතීයැයි අපේක්ෂා කෙරේ. | විල්ගමුව ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදි කිරීමේ අවශ්‍යතාවය නිසි පරිදි ඇගයීම් කර නොමැති අතර, ව්‍යාපෘතිය මඟින් සපයන ලද අරමුදල් නාස්ති වී තිබුණි. |
| (එ) | නිසි ජල මූලාශ්‍රවල හිඟකම හේතුවෙන් විල්ගමුව ජල සම්පාදන යෝජනා ක්‍රමය භාවිතා නොකර පැවතුණි. | ප්‍රදේශයේ පවුල් 350 සඳහා ජල සැපයුම් පහසුකම් සපයා නොතිබුණි. | ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර ජලයේ ගුණාත්මකභාවය සහ ප්‍රමාණය පිළිබඳ පරීක්ෂාවක් සිදුකරන ලද අතර ඒ අනුව යෝජනා ක්‍රමයේ ධාරිතාවය තීරණය කරන ලදී. කෙසේවෙතත් ඉදිකිරීමෙන් පසු වියළි කාලගුණික තත්ත්වය හේතුවෙන් ජල සැපයුමේ ප්‍රමාණය අඩු වී තිබුණු බව නිරීක්ෂණය විය. | වරද නිවැරදි කිරීම සඳහා විශේෂඥයෙකුගේ උපදෙස් ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඒ) | ජලයේ අඩු ගුණාත්මකභාවය හේතුවෙන් දික්ලන්ද ජල සැපයුම් යෝජනා ක්‍රමය නිෂ්කාර්යව පැවතුණි. | පොදු මහජනතාව වෙත අපේක්ෂිත ප්‍රතිලාභ නොලැබේ. | සැලසුම් අදියරේදී ජලයේ ගුණාත්මකභාවය පානීය කටයුතු සඳහා සුදුසු බව ජල සම්පත් මණ්ඩලය විසින් නිර්දේශ කර ඇත. කෙසේවෙතත්, ඉදි කිරීමෙන් පසු මෙම තත්ත්වය වෙනස් වී තිබුණි. | වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට පියවර ගත යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 1/2016 දරන චක්‍රලේඛයේ 2.2.4 වගන්තියට එරෙහිව ව්‍යාපෘති අධ්‍යක්ෂක වැඩබලන පදනම මත පත්කර තිබුණි. | ව්‍යාපෘතියේ කටයුතුවල ක්‍රියාකාරීත්වයට බලපානු ලැබේ. | ව්‍යාපෘතියේ හදිසි අවශ්‍යතාවය හේතුවෙන් අනෙකුත් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂක වැඩබලන පදනම මත පත්කර තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගතවීම අවශ්‍ය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 1/2016 දරන චක්‍රලේඛයේ 2.2.9 දරන වගන්තියේ අවශ්‍යතා අනුව අවම සුදුසුකම් රහිතව දකුණු පළාතේ උප කාර්යාලයේ සහකාර ඉංජිනේරු සහ සහකාර ප්‍රමාණ සමීක්ෂක ලෙස පුද්ගලයින් පත්කර තිබුණු බව නිරීක්ෂණය විය. | -එම- | නිසි පරිදි ප්‍රතිචාර දක්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් වලට අනුව ප්‍රධාන කාර්ය මණ්ඩල සමාජිකයින් පත්කර ගැනීම අවශ්‍ය වේ. |
| (ඇ) | නිසි බඳවා ගැනීම් පටිපාටියක් අනුගමනය කිරීමෙන් පසු 2018 මැයි 08 දින නිලධාරියකු තෝරා ගෙන නිර්දේශ කර තිබුණද, ප්‍රධාන ඉංජිනේරු තනතුර වැඩ බලන පදනමින් බඳවා ගෙන තිබුණි. | -එම- | දකුණු පළාතේ ප්‍රධාන ඉංජිනේරු තනතුරෙහි පුරප්පාඩුවක් පැවතුණු නිසා 2018 ජනවාරි සිට අමතර රාජකාරි පදනමින් පළාතේ ප්‍රධාන ඉංජිනේරු පත් කිරීමට ප්‍රධාන ලේකම් නිර්දේශ කර තිබුණි. | තෝරාගත් පුද්ගලයා පත්කර ගත යුතු අතර වගකීම මාරු විය යුතුය. |